# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.

+94112785141-50 | +94112784846
isurupaya@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. } ED/09/15/02/11/දේ

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2024.06.28

විදුහල්පති

රාජකීය විද්‍යාලය

කොළඹ 07

**<u>BLUE & GOLD කුසලාන අන්තර් පාසල් සත් සාමාජික හොකී තරගාවලිය - 2024</u>**

උක්ත කරුණ සම්බන්ධ ඔබගේ දින රහිත ලිපිය හා බැඳේ.

02. ඔබ විසින් 2024.08.10 හා 11 යන දෙදින කොළඹ 07, රාජකීය විද්‍යාලයීය ක්‍රීඩාංගනයේදී පැවැත්වීමට නියමිත උක්ත තරගාවලිය සඳහා පහත කොන්දේසි යටතේ අනුමැතිය ලබා දෙන බව කාරුණිකව දැනුම් දෙමි.

**<u>කොන්දේසි</u>**

1. තරගාවලිය පැවැත්වීමේ දී රටේ පවතින සෞඛ්‍ය තත්වය පිළිබඳව දැඩි අවධානයක් යොමු කර කොවිඩ්-19 රෝග පැතිරීම වැලැක්වීමේ මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු ය.
2. තරගාවලිය පැවැත්වීමේදී කලාප, පළාත් හා සමස්ත ලංකා පාසල් ක්‍රීඩාවලට බාධාවක් නොවන පරිදි පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කළ යුතු ය.
3. සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධා නොවන අයුරින් තරගාවලිය පැවැත්විය යුතු ය.
4. පාසල් හි වාර පරීක්ෂණ සඳහා බාධා ඇති නොවන පරිදි තරගාවලිය පැවැත්විය යුතු ය.
5. අවුරුදු 12 න් පහළ සිසුන් සඳහා තරගකාරිව තරග නොපැවැත්විය යුතු ය.
6. පාසල් සිසුන්ගේ විනය සුරැකීමේ වගකීම හා සිසුන්ගේ ආරක්ෂාව උපරිම ලෙස තහවුරු කිරීම විදුහල්පති රාජකීය විද්‍යාලය, කොළඹ 07 විසින් දැරිය යුතු ය.
7. සහභාගී වන සෑම සිසුවෙකුගේම දෙමාපියන්ගෙන් තරගාවලියට පෙර තම දරුවා මෙම තරගය සඳහා සහභාගී කරවීමට කැමැත්ත ප්‍රකාශ කළ ලිපියක් විදුහල්පති විසින් සහතික කර ලබා ගත යුතු ය.
8. තරගාවලියේ සහතික පත්‍ර, කැඳවීම් ලිපි හා අනෙකුත් ලේඛන මුද්‍රණයේදී අන්තර් පාසල් හොකී තරගාවලිය - 2024 ලෙස සඳහන් කළ යුතු ය (සමස්ත ලංකා යන්න භාවිතා නොකළ යුතු ය).
9. හොකී ක්‍රීඩාවට අදාළ පාසල් සංගමය මගින් ක්‍රියාත්මක කරනු ලබන නීතිරීති උල්ලංඝනය නොවන පරිදි තරගාවලිය පැවැත්විය යුතු ය.
10. අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇති බව දන්වමින් පාසල් වෙත යොමු කිරීමට සකසන ලිපියේ, අමාත්‍යාංශ ලිපියේ අංකය හා දිනය ඇතුළත් කළ යුතු ය. එහි පිටපතක් පාසල් වලට යැවීමට ප්‍රථම මා වෙත ද එවිය යුතු ය.


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister } +94112784832 | +94112784825

ලේකම් / செயலாளர் / Secretary } +94112784811 | +94112785162

11. තරගාවලිය අවසන් වී සතියක් ඇතුලත අදාළ තරගාවලිය සම්බන්ධව සම්පූර්ණ අය වැය වාර්තාවක් ඉදිරිපත් කල යුතු ය. යම් නිලධාරියෙකුට සිදු කරනු ලබන දීමනා ද එකිනෙක එහි සඳහන් කල යුතු ය.

12. මෙම තරගාවලිය සඳහා පළාත් පාසල් සහභාගි වන්නේ නම් මෙම අමාත්‍යාංශය මඟින් නිකුත් කළ අනුමත ලිපියේ අංකය හා දිනය සඳහන් කර අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් අනුමැතිය ලබා ගත යුතු ය.

13. තරගාවලිය පැවැත්වෙන අධ්‍යාපන කලාපයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා) හෝ අදාළ පළාත් නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා) යන නිලධාරියකු මෙම තරගාවලියේ අධීක්ෂණ නිලධාරී ලෙස සහභාගී කර ගත යුතු ය.

14. තරගාවලිය පැවැත්වීම සඳහා අනුග්‍රාහක ආයතනයකින්/ පරිත්‍යාග මඟින් ප්‍රතිපාදන සපයා ගන්නේ නම් එය චෙක්පතක් මඟින් ලබාගෙන ඔබ සංගමයේ ගිණුමට බැර කළ යුතු ය. එම ප්‍රතිපාදන විගණනයට යටත් වන බැවින් විධිමත් පරිදි අනුමත නීති රීති යටතේ වියදම් දැරිය යුතු ය. අදාළ චක්‍රලේඛ අනුගමනය කළ යුතු ය.

15. තරග පැවැත්වීමේ දී අදාළ භාණ්ඩ හා සේවා සපයා ගැනීම සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු ය.

16. සියලු ආදායම් වියදම් ගිණුම් ගත කළ යුතු අතර වියදම් චෙක්පත් මඟින් පමණක් දැරිය යුතු යි.

17. අධ්‍යාපන අමාත්‍යාංශ හා සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ හා උපදෙස් සංග්‍රහ අනුව සිසුන්ගේ ආරක්ෂාව සහතික කළ යුතු ය.

18. හදිසි අවශ්‍යතා සඳහා ගිලන් රථයක්, වෛද්‍ය සේවා පහසුකම් සූදානම් කර තරග පැවැත්වෙන ස්ථානයේ තිබිය යුතු ය (ගිලන් රථයේ අදාළ පහසුකම් පවතී ද යන්න අදාළ බලධාරීන් විසින් පරීක්ෂා කර සහතික කර ගත යුතු ය).

ඒ.ඩබ්.නානායක්කාර
අධ්‍යාපන අධ්‍යක්ෂ (රා/ආ)
ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා

අත්.කළේ: පී.සී.කේ.පිරිස්යාල
අතිරේක ලේකම්
විෂය සමගාමී හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන
ලේකම් වෙනුවට

පිටපත් -

1. සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් - කරු.දැ.ගැ.ස. (මාර්ගගත ක්‍රමයට)
2. සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු.දැ.ගැ.ස.
3. සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු.දැ.ගැ.ස. (මාර්ගගත ක්‍රමයට)
4. ලේකම්, ශ්‍රී ලංකා පාසල් හොකී සංගමය - කරු.දැ.ගැ.ස. සහ අ.කා.ස.